# කැන්ඩ්ල් ඒඩ් ලංකා

**නො:21/4, ධර්මරත්න මාවත රාවතාවත්ත මොරටුව.**
**ටෙලි / +94-11-2642526 / 264342 / 264415/ 076-0534404 (Whatsapp)**
**ඊ මේල් ලිපිනය: candleaid.food@gmail.com**

**මව සහ දරුවා ව්‍යාපෘතිය**

**ආධාරලාභීන් සහ සම්බන්ධීකරණ නිලධාරී වෙත තොරතුරු.**

**<u>තොරතුරු.</u>**

1) මෙම ව්‍යාපෘතියෙන් ආධාර ලැබීම සඳහා ආධාරලාභී පවුලක අවම වශයෙන් දරුවන් දෙදෙනෙකුවත් සිටිය යුතුය.

2) මේ සඳහා MCP 001 පත්‍රිකාව නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කොට ඉහත සඳහන් අප ආයතනයේ ලිපිනය වෙත යොමු කරන්න. ඉල්ලුම්පත සලකා බලා තීරණය කර , පසුව ඒ බව ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ.

3) MCP 002 CD පත්‍රිකාව සම්බන්ධීකරණ නිලධාරී විසින් සම්පූර්ණ කල යුතුය. එක් සම්බන්ධීකරණ නිලධාරියෙකුට පවුල් කිහිපයක සම්බන්ධීකරණ කටයුතු සිදුකල හැක.නමුත් එය ඵලදායීතාවය අඩු කිරීමට හේතුවන බව සඳහන් කල යුතුය .

**<u>වගකීම්.</u>**

ආධාරලාභී පවුලට සෘජුවම මුදල් තැන්පත් කරනු ලබන අතර එම මුදලින් ආහාර ද්‍රව්‍ය සඳහා හෝ වෙනත් වුවමනාවක් සඳහා යොදා ගෙන මාස 4 කට වරක් සම්පූර්ණ කරන ලද MCP 004 පත්‍රිකාව සමඟ වියදම් කල ආකාරය පිලිබඳව කෙටි විස්තරයක් සහිතව ආධාරලාභියා විසින් අප වෙත එවන බවට සම්බන්ධීකාරක නිලධාරීන් වග බලා ගත යුතුය.

1) කැන්ඩ්ල් ඒඩ් ලංකා ආයතනය දැන්වූ අවස්ථාවක සම්බන්ධීකරණ නිලධාරී රැස්වීම සඳහා ඔබ සහභාගී විය යුතුය.

2) මෙම ව්‍යාපෘතිය සාර්ථක ලෙස පවත්වාගෙන යෑම සඳහා ඔබගේ සහයෝගය සහ උනන්දුව අවශ්‍ය වේ. එසේම පවුලේ ප්‍රගතිය පිළිබඳව සොයා බැලීම, ඔබගේ වගකීම් සහ කාර්යයන් ඉටුකිරීමද ඔබ සතු යුතුකමකි.

**<u>කැන්ඩ්ල් ඒඩ් ලංකා ආයතනය වෙත ඔබගේ යුතුකම්.</u>**

**1) <u>පළමු ස්තුති ලිපිය</u>**

පළමු දීමනාව ලබා දී **<u>දෙසතියක් ඇතුලත</u>** කැන්ඩ්ල්ඒඩ් ආයතනයට ආමන්ත්‍රණය කොට ප්‍රථම ස්තුති ලිපිය ආධාරලාභියා විසින් ලියා එවිය යුතු මෙම ලිපිය A4 පත්‍රිකාවක ලිවිය යුතුය.

**2) <u>මුදල් ලබා ගත් බව සහතික කෙරෙන MCP 004 පත්‍රිකාව</u>**

සෑම මසකම පළමු සතිය තුළ දීමනාව ලබාගත් පසුව කාර්යාල නීති අනුව **<u>මාස 4 කට වරක් 15 වන දිනට පෙර (මාර්තු 15 පෙර, ජූලි 15 පෙර, සහ නොවැම්බර් 15 පෙර )</u>** සම්පූර්ණකරන ලද MCP 004 පත්‍රිකාව සමඟ පසු පිටෙහි දීමනාව වියදම් කල ආකාරය පිලිබඳව කෙටි විස්තරයක් සහිතව කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය.

**3)** අවසන් ස්තුති ලිපිය - දීමනාව ලැබූ දින සිට මාස 11 කට පසු **<u>ඔබගේ පවුලේ වර්තමාන විස්තර සහ ප්‍රගතිය පිලිබඳ තොරතුරු ද ඇතුලත් කරමින් මෙම ස්තුති ලිපිය අදාල මස 15 වන දිනට පෙර අප වෙත යොමු කල යුතුය.</u>**

**යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් 011-2642526 / 076-0534404 යන අංකයෙන් දෙවින්කා ප්‍රනාන්දු මෙනවිය අමතන්න.**

ස්තුතියි
මෙයට විශ්වාසී,

යැස්මින් වීරසූරිය
ආහාර ව්‍යාපෘතිය - අධ්‍යක්ෂිකා සහ ප්‍රධාන නිලධාරිනි
කැන්ඩ්ල්ඒඩ් ලංකා

***<u>"It is better by far to light a solitary candle than to curse the darkness"</u>***